Remove Watermark Now

කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර zonal Education Office – Kalutara வலயக்கல்விக் காரியாலயம் களுத்துறை

# කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර

## මධ්‍ය වාර පරීක්ෂණය - 2018

| 11 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I | කාලය පැය 01 යි |
|---|---|---|

කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර zonal Education Office – Kalutara வலயக்கல்விக் காரியாலயம் களுத்துறை කලාප අධ්‍යාපන කාර්යාලය - කළුතර කලාප අධ්‍යාපන කාර්යාලය

පහත සඳහන් සිද්ධිය කෙරෙහි අවධානය යොමු කරමින් අංක 01 සිට 04 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සයන්න.

ඇඳුම් මැසීම පිළිබඳ වෘත්තීය පුහුණු පාඨමාලාවක් හදාරා ඇති ඩම්නි ස්වයං රැකියාවක් ලෙස ඇඳුම් මැසීමේ හා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. තමන් යෙදවූ මුදලට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලැබීමත් සාධාරණ මිලකට ඇඳුම් මැසීම හා අලෙවි කිරීමත් ඇයගේ ව්‍යාපාරයේ අරමුණ වේ. පවුලේ ආහාර පාන , දරුවන්ගේ අධ්‍යාපන කටයුතු, සෞඛ්‍ය පහසුකම් ආදී දෑ සඳහා මුදල් වැයකර සෑම මසකම රු. 10000 ක මුදලක් ඇය ලංකා බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කරයි.

01. ඉහත සිද්ධියේ ඇතුළත් වන මිනිස් අවශ්‍යතාවක් හා ඊට අදාළ වුවමනාවක් දැක්වෙන පිළිතුර වනුයේ,
   1. ඇඳුම් පැළඳුම් - ස්වයං රැකියා
   2. අධ්‍යාපනය - වෘත්තීය පාඨමාලා
   3. සෞඛ්‍ය - ආහාර පාන
   4. ලංකා බැංකුව - ඉතිරි කිරීම

02. මෙම සිද්ධියේ සඳහන් වන ප්‍රධාන ව්‍යාපාර අරමුණ වන්නේ ,
   1. සාධාරණ මිලකට ඇඳුම් මැසීම හා අලෙවි කිරීමය.
   2. තම දක්ෂතා තුළින් ප්‍රයෝජන ගැනීම ය.
   3. සෑම මසකම රු.10 000 ක මුදලක් ඉතිරි කිරීමය.
   4. ලාභ ඉපැයීම ය.

03. මෙම සිද්ධියේ සඳහන් වන ලංකා බැංකුව ,
   1. පුද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයකි.
   2. සුළු පරිමාණ ව්‍යාපාර සංවිධානයකි.
   3. රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානයකි.
   4. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධානයකි.

04. මෙම ව්‍යාපාරයට ශක්තියක් වී ඇත්තේ,
   1. ස්වයං රැකියාවක් කිරීමට ඇය තුළ ඇති කැමැත්ත ය.
   2. පවුලේ වියදම් සඳහා මුදල් ඉපයීම ය.
   3. ලංකා බැංකුවේ රු.10000 ක මුදලක් ඉතිරි කිරීම ය.
   4. ව්‍යාපාරය සම්බන්ධයෙන් වෘත්තීය පාඨමාලාවක් හදාරා තිබීම ය.

05. ඇල්මැති පාර්ශවයන්ගේ අරමුණු කිහිපයක් පහත දැක්වේ.
   A. රැකියා අවස්ථා
   B. රැකියා සුරක්ෂිත බව
   C. රැකියා වර්ධනය
   D. ව්‍යාපාරයේ අනාගත වර්ධනය

   ඉහත අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂිත ඇල්මැති පාර්ශ්වයන් අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ ,
   1. A අයිතිකරුවන් B කළමනාකරුවන් C සේවකයන් D රජය
   2. A රජය B සේවකයන් C කළමනාකරුවන් D අයිතිකරුවන්
   3. A සේවකයින් B අයිතිකරුවන් C රජය D කළමනාකරුවන්
   4. A කළමනාකරුවන් B රජය C අයිතිකරුවන් D සේවකයන්

06. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හඳුන්වා දෙන පරිදි සේවක සංඛ්‍යාව 25 කට අඩු ව්‍යාපාර ,
   1. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වේ.
   2. රාජ්‍ය දෙපාර්තමේන්තු වේ.
   3. රාජ්‍ය සංස්ථා වේ.
   4. මහා පරිමාණ ව්‍යාපාර වේ.

- අංක 7 හා 8 ප්‍රශ්න සඳහා පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

ව්‍යාපාර වර්ග කිහිපයක් හා එම ව්‍යාපාර වර්ග අතර පවතින ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

| ව්‍යාපාර සංවිධාන / ලක්ෂණය | තනි පුද්ගල ව්‍යාපාර | හවුල් ව්‍යාපාර | සමාගම් | සමූපකාර | සංස්ථා | දෙපාර්තමේන්තු |
|---|---|---|---|---|---|---|
| අයිතිය | A | | B | C | | D |
| වගකීම | | E | | | | |
| පැවැත්ම | | | F | | | G |
| නෛතික පුද්ගලභාවය | | | | | H | |

papers.lk pdfelement

Remove Watermark Now

07. ඉහත A,B,C,D පිළිවෙලින් දැක්වෙන්නේ ,
1. එක් අයෙකු / කොටස්කරුවන්/රජය/රජය සතු වේ
2 .එක් අයෙකු/සාමාජිකයන්/සාමාජිකයන්/රජය සතු වේ
3. එක් අයෙකු/ කොටස්කරුවන්/සාමාජිකයන්/රජය සතු වේ
4. එක් අයෙකු / කොටස්කරුවන්/කොටස්කරුවන්/රජය සතු වේ

08. ඉහත E,F,G, හා H අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,
1. අසීමිතය/අඛණ්ඩ/රජයේ අභිමතය පරිදි/ඇත.
2. සීමිතය/අඛණ්ඩ/දිගු කාලීන/නැත
3. අසීමිතය/රජයේ අභිමතය පරිදි/කෙටිකාලීන /ඇත
4. සීමිතය/අඛණ්ඩ නොවේ/දිගු කාලීන නොවේ/නැත

09. චෙක්පතක ඇතුළත් මූලිකාංගක් නොවන්නේ ,

1.අණලදුගේ නම    2. ගෙවූ මුදල් ප්‍රමාණය    3. සිදු වූ ගණුදෙනුව    4. අණකරුගේ ආදර්ශ අත්සන

10. පහත සඳහන් වගන්ති අතුරින් නිවැරදි වගන්තිය තෝරන්න.
1. හරපතක් ලබා ගැනීම සඳහා වාණිජ බැංකුවක ගිණුමක් තිබිය යුතුය.
2. ණයකාඩ්පතක් ඕනෑම බැංකුවකින් ලබා ගත හැකිය.
3. හර කාඩ්පත් හා ණය කාඩ් පත්වලින් ඕනෑම මුදල් ප්‍රමාණයක් ආපසු ලබා ගත හැකිය.
4. හර කාඩ්පත් භාවිතකර ATM යන්ත්‍ර මගින් මුදල් ලබා ගත නොහැකිය .

11. රක්ෂණයට සම්බන්ධ පාර්ශ්වයන් අතුරෙන් දෙවන පාර්ශ්වය ලෙස හඳුන්වන්නේ ,
1. රක්ෂණ ආවරණය ලබන පාර්ශ්වයයි.
2. රක්ෂණ ගිවිසුම යටතේ ආවරණය ලබා දෙන පාර්ශ්වයයි.
3. රක්ෂණ ගිවිසුමෙන් බලපෑමක් වන අනෙකුත් සියලුම පාර්ශ්වයි.
4. ඉහත සියලුම පාර්ශ්වයන්ගේ එකතුවයි.

12. ඉතා ඉක්මනින් වැඩි පිරිසකට එකවර ආකර්ශනීය ලෙස තොරතුරු දැනුම් දිය හැකි සන්නිවේදන ක්‍රමයක් වන්නේ,
1. රූපවාහිනිය    2. අන්තර් ජාලය    3. විද්‍යුත් තැපැල    4. ගුවන් විදුලිය

13. ගුවන් ප්‍රවාහනයේ දැකිය හැකි වාසියක් වනුයේ,
1. පිරිවැය අධික වීම    2. ඕනෑම අවස්ථාවකදී යොදා ගත හැකි වීම
3. ගමනාන්තයට යා හැකි වීම    4. ඉක්මනින් ළඟා විය හැකි වීම.

14. පහත දැක්වෙනුයේ වෙළෙඳාමක් සිදු වූ අවස්ථා කිහිපයකි.

A - දානයක් දීම සඳහා පරිප්පු 25 kg ක් විකිණීම
B - ලී බඩු නිෂ්පාදකයෙකු, ලී බඩු වෙළෙන්දෙකුට ලී බඩු විකිණීම
C - බේකරි නිෂ්පාදකයෙකු ආපනශාලාවකට පාන් 25 ක් විකිණීම
ඉහත අවස්ථා අතුරෙන් තොග වෙළෙඳාමට අයත් වන්නේ,

1. A හා B ය.    2. A හා C ය.    3. B හා C ය.    4.AB හා C ය.

15. කළමනාකරණ ක්‍රියාවලියට අයත් කාර්යයන් පහත දැක්වේ.
A - මෙහෙයවීම    C - පාලනය
B - සැලසුම්කරණය    D - සංවිධානකරණය
මෙම කාර්යයන් අනුපිළිවෙලින් ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

1.C,D,B හා A ය.   2. B,D,A හා C ය.   3. D,B,C හා A ය.   4.B,D,C හා A ය.

16. පහත සඳහන් විචල්‍යයන් අතුරෙන් අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයක් නොවන්නේ,
1. නිෂ්පාදිතය    2. මිල    3. ස්ථානය    4. ඉල්ලුම

17. කිසියම් අයිතමයක් වත්කමක් ලෙස ව්‍යාපාරයේ පොත්වල සටහන් කිරීම සඳහා පැවතිය යුතු ප්‍රධාන නිර්ණායකය වන්නේ ,
1. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම.    2. ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරය තුළට ගලා ඒම.
3. එහි වටිනාකම විශ්වාසදායී ලෙස මුදලින් මැනිය හැකි වීම.    4. ව්‍යාපාරයේ පාලනයට යටත්වීම.

papers.lk pdfelement

18. නිවැරදි ගිණුම්කරණ සමීකරණය තෝරන්න.
1. වගකීම් = වත්කම් + හිමිකම්
2. හිමිකම් = වත්කම් - වගකීම්
3. වත්කම් = හිමිකම් - වගකීම්
4. හිමිකම් = වත්කම් + වගකීම්

19. දර්ශනගේ ව්‍යාපාරයේ 2018.01.01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ.
වත්කම් = ප්‍රාග්ධනය + වගකීම්
175000 = 150000 + 25000

රු. 10000 ක භාණ්ඩ තොගයක් රු.15000 කට අලෙවිකිරීමෙන් පසු නිවැරදි ගිණුම්කරණ සමීකරණය වන්නේ,
1. 190000 = 165000 + 25000
2. 185000 = 160000 + 25000
3. 180000 = 155000 + 25000
4. 180000 = 150000 + 30000

20. ලිතුමිගේ ව්‍යාපාරයේ 2017.01.01 දිනට හිමිකම රු.150000 ක් වූ අතර 2017.12.31 දිනට හිමිකම් රු.10000 කින් වෙනස් විය. හිමිකමේ සිදු වූ මෙම වෙනස් වීමට හේතුවක් නොවිය හැක්කේ,
1. ව්‍යාපාරයේ භාවිතය සඳහා මෝටර් රථයක් මිලට ගැනීම
2. අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි
3. ව්‍යාපාරයේ ශුද්ධ ලාභය අඩුවීම
4. අමතර ප්‍රාග්ධනය යෙදීම

21. පහත X තීරුවේ මූලික පොත්ද, Y තීරුවේ මූලාශ්‍ර ලේඛනද දැක්වේ.

| X | Y |
|---|---|
| පොදු ජර්නලය | A – ලදු පත්‍රය |
| ගැනුම් ජර්නලය | B - බැරපත |
| මුදල් පොත | C - ජර්නල් වවුචරය |
| බැංකු ගිණුම | D - පිළිපත |
| | E - ගැනුම් ඉන්වොයිසිය |

X තීරුවේ දැක්වෙන මූලාශ්‍ර ලේඛන Y තීරුවේ දැක්වෙන මූලික පොත් සමග අනුපිළිවෙලින් ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ,
1. A, B, C, හා D ය. 2. B,A,C, හා D ය. 3. C,A,D, හා B ය. 4. C,E,A, හා D ය.

22. විදාරා තම පෞද්ගලික බැංකු ගිණුමෙන් ව්‍යාපාරයේ ණය හිමියෙකුට රු 10000 ක් ගෙවන ලදී. මෙම ගනුදෙනුව සටහන් කිරීමට අදාළ ද්විත්ව සටහන වනුයේ,

1. ණය හිමි ගිණුම හර රු.10000
 මුදල් ගිණුම බැර රු.10000
2. ණය හිමි ගිණුම හර රු.10000
 බැංකු ගිණුම බැර රු.10000
3. මුදල් ගිණුම හර රු.10000
 ණය හිමි ගිණුම බැර රු.10000
4. ණය හිමි ගිණුම හර රු. 10000
 ප්‍රාග්ධන ගිණුම බැර රු.10000

23. ව්‍යාපාරයක ගනුදෙනු ගිණුම්ගත කිරීමේදී ද්විත්ව කාර්යයක් ඉටු කරනු ලබන්නේ,
1. සුළු මුදල් පොත යි.
2. ප්‍රධාන ජර්නලය යි.
3. ගැනුම් ජර්නලය යි.
4. විකුණුම් ජර්නලය යි.

24. චාන්දනී තම ව්‍යාපාරය සඳහා රු.25500 ක ලීබඩු මිලට ගෙන, ඒ සඳහා රු.25000 ක චෙක්පතක් නිකුත් කර ඉතිරිය සුළු මුදලින් ගෙවන ලදී. සුළු මුදලින් ගෙවන ලද වටිනාකම සුළු මුදල් පොතේ සටහන් කරනුයේ,
1. විවිධ වියදම් තීරුවේය 2.ලෙජර තීරුවේ ය. 3. ලෙජර පිටුව තීරුවේය 4. ලී බඩු තීරුවේය

25. ව්‍යාපාරයක මුදල් වට්ටම් ඇති වන්නේ,
1. භාණ්ඩ ණයට ගැනීමේදී ය.
2. භාණ්ඩවල ලකුණු කළ මිළ අඩු කිරීමේදී ය.
3. භාණ්ඩ ණයට විකිණීමේදී ය .
4. නියමිත කාලය තුළ ණය බේරුම් කිරීමේදී ය .

26. මාසික බැංකු ප්‍රකාශය ලැබෙන තෙක් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් කළ නොහැකි අයිතමය වන්නේ
1. තැන්පත් කළ චෙක්පත්
2. බැංකු ගාස්තු
3. නිකුත් කළ අගරු වූ චෙක්පත්
4. නිකුත් කළ චෙක්පත්

Remove Watermark Now

- පහත සඳහන් තොරතුරු සැලකිල්ලට ගනිමින් අංක 27 හා 28 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දම්සිතගේ ව්‍යාපාරයේ 2017.03.31 දිනට බැංකු ගිණුමේ ශේෂය රු.15300 ක් විය. එදිනට බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයෙන් උපුටා ගත් තොරතුරු පහත දැක්වේ.

| | දිනය | විස්තරය | හර (රු) | බැර (රු) | ශේෂය (රු) |
|---|---|---|---|---|---|
| A | 03.01 | ශේෂය | | | 12500.00 |
| B | 03.05 | මුදල් තැන්පතු | | 25000.00 | |
| C | 03.08 | සෘජු ප්‍රේෂණ | | 10000.00 | |
| D | 03.12 | චෙක් - 323216 | 18000.00 | | |
| E | 03.18 | ස්ථාවර නියෝග - කඩ කුලී | 12000.00 | | |
| F | 03.25 | චෙක් - 562615 | | 5000.00 | |
| G | 03.31 | බැංකු ගාස්තු | 3000.00 | | ? |

27. ඉහත ඇති බැංකු ප්‍රකාශනයේ 2017.03.31 දිනට දැක්විය යුතු ශේෂය වනුයේ

1. රු.19 500 2. රු. 52 500 3. රු. 45 500 4. රු. 12 500

28. ඉහත සඳහන් ප්‍රකාශනයට අනුව ව්‍යාපාරයේ බැංකු ගිණුම සංශෝධනය කිරීමේදී එහි බැර පැත්තේ සටහන් කරනු ලබන අයිතම් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. B,C හා F ය. 2. D,E හා G ය. 3. E හා G ය. 4. B හා C ය.

29. 2017.12.31 දිනට මිහිකතගේ ව්‍යාපාරයේ පිළියෙල කළ ශේෂ පිරික්සුමේ හර තීරුවේ එකතුව බැර තීරුවේ එකතුවට සමාන විය. එමගින් පෙන්නුම් කරන්නේ,

01. ව්‍යාපාරයේ ගිණුම් තැබීම නිවැරදිව සිදුවී ඇති බවයි.
02. ව්‍යාපාරයේ සිදු වූ සියළු ගනුදෙනු පොත්වල සටහන්කර ඇති බවයි.
03. ශේෂ පිරික්සුමේ ඓක්‍යය නිවැරදි බවයි.
04. දෙසැම්බර් 31 දිනට පවතින සියලු ගිණුම්වල ශේෂයන් ශේෂ පිරික්සුමට ගෙන ගොස් ඇති බවයි.

30. ශේෂ පිරික්සුම තුලනය වීමට බලපෑමක් ඇති නොවන ගිණුම්කරණ වැරැද්ද වන්නේ,

1. රු.5000 ක ඉන්ධන වියදම් මුදල් ගිණුමට පමණක් පිටපත් වීම
2. රු. 7500 ක් වූ රක්ෂණ ගාස්තු අදාළ ගිණුම්වල රු 750 ක් ලෙස සටහන් වීම .
3. ලී බඩු ගැණුම් රු 15000, ගැනුම් ගිණුමට රු 51000 ක් ලෙස සටහන් වීම
4. ණය හිමියෙකුට ගෙවූ රු 4000 ක් ණය හිමියාගේ ගිණුමේ වැරදි පැත්තේ සටහන් වීම

31. ණය ගැතියෙකුගෙන් ලද රු 3000 ක් ණය ගැතියාගේ ගිණුමේ වැරදි පැත්තේ සටහන් වීම නිවැරදි කිරීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,

1. ණය ගැති ගිණුම හර 3000
   විනිශ්චිත ගිණුම බැර 3000
2. අවිනිශ්චිත ගිණුම හර 6000
   ණය ගැති ගිණුම බැර 6000
3. ණය ගැති ගිණුම හර 6000
   අවිනිශ්චිත ගිණුම බැර 6000
4. ණය ගැති ගිණුම හර 6000
   මුදල් ගිණුම බැර 6000

32. මාලිමාගේ ව්‍යාපාරයේ මාසික ගෙවල් කුලිය රු 4000 ක් වන අතර 2017 වර්ෂය තුළදී මුදලින් ගෙවූ ගෙවල් කුලිය රු 40000 කි. මෙම ව්‍යාපාරයේ ගෙවල් කුලියට අදාළව ලාභාලාභ ප්‍රකාශයේ හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පිළිවෙලින් ඇතුළත් කළ යුතු අගයයන් වන්නේ,

1. රු.48000 ක් හා රු. 8000
2. රු.44000 ක් හා රු.4000
3. රු.40000 ක් හා රු. 4000
4. රු.48000 ක් හා රු.40000

33. ව්‍යාපාරයේ මුදලින්, එහි හිමිකරු තම පෞද්ගලික දුරකථන ගාස්තු රු.3000 ක් ගෙවීම සටහන් කරනුයේ,

1. දුරකථන ගිණුම හර 3000
   මුදල් ගිණුම 3000
2. ගැනිලි ගිණුම හර 300
   මුදල් ගිණුම 300
3. ගැනිලි ගිණුම හර 3000
   මුදල් ගිණුම 3000
4. මුදල් ගිණුම හර 3000
   ගැනිලි ගිණුම 3000

34. ණය ගැතියෙකු වන අප්සරාගෙන් ලැබිය යුතු රු 4000 ක් නොලැබෙන ණය ලෙස කපා හැරීමට ව්‍යාපාරයක් තීරණය කර ඇත. එම අගය සටහන් කරනුයේ,

1. ණයගැති ගිණුම හර 4000
   බොල් ණය ගිණුම 4000
2. මුදල් ගිණුම හර 4000
   බොල් ණය ගිණුම 4000
3. බොල් ණය ගිණුම හර 4000
   ණයගැති ගිණුම 4000
4. ණයගැති ගිණුම හර 4000
   විකුණුම් ගිණුම 4000

35. විකුණූ බඩුවල පිරිවැය දැක්වෙන අයිතම් නිවැරදිව ඇතුළත් කාණ්ඩය වන්නේ ,
1. ආරම්භක තොගය + ගැණුම් + අවසාන තොගය
2. ගැණුම් + බෑමේ කුලිය + ආරම්භක තොගය
3. විකුණුම් - ගැනුම් + අවසාන තොගය
4. ආරම්භක තොගය + ගැනුම් - අවසාන තොගය

- ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට පහත තොරතුරු උපයෝගී කරගනිමින් පිළිතුරු සපයන්න.
  සහන්ගේ ව්‍යාපාරයේ 2017.12.31 දිනට ශේෂ පිරික්සුම පහත වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| 2017/01/01 දිනට බඩු තොගය | 20 000 | |
| ගැනුම් | 180 000 | |
| විකුණුම් | | 320 000 |
| විදුලි ගාස්තු | 8 000 | |
| ණය ගැතියෝ | 30 000 | |
| බැංකු ණය | | 100 000 |
| ලී බඩු | 45 000 | |
| ගොඩනැගිලි | 250 000 | |
| රක්ෂණ ගාස්තු | 6 000 | |
| ප්‍රචාරණ ගාස්තු | 4 000 | |
| ණය පොලී | 9 000 | |
| ණය හිමියෝ | | 25 000 |
| ලද වට්ටම් | | 4 000 |
| දුන් වට්ටම් | 2 000 | |
| **මුදල්** | **3 4 000** | |
| වැටුප් | 6 000 | |
| ප්‍රාග්ධනය | | 145 000 |
| | 594 000 | 594 000 |

**අතිරේක තොරතුරු :**
1. 2017/12/31 දිනට බඩු තොගය රු.25000
2. 2017/12/31 දිනට ගෙවිය යුතු ණය පොලී රු . 1000
3. ණය ගැතියන්ගෙන් රු.4000 ක් බොල් ණය ලෙස කපා හැරීම.

36. මෙම ව්‍යාපාරයේ 2017/12/31 දිනට විකුණුම් පිරිවැය වනුයේ,
1. රු.175 000 2. රු.200 000 3. රු.180 000 4.රු.155 000

37. මෙම ව්‍යාපාරයේ 2017/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය වනුයේ,
1. රු 109 000 2. රු.105 000 3. රු 149 000 4. රු.100 000

38.2017.12.31 දිනට මෙම ව්‍යාපාරයේ ජංගම වත්කම්වල අගය වනුයේ ,
1. රු.89 000 2. රු.85 000 3. රු 70 000 4. රු.80 000

39. 2017.12.31 දිනට මෙම ව්‍යාපාරයේ මුළු හිමිකම වනුයේ,
1. රු145 000 2. රු.109 000 3. රු.354 000 4. රු.254 000

40. මෙම ව්‍යාපාරයේ 2017/12/31 දිනට මුළු වගකීම් වනුයේ,
1. රු.100 000 2. රු.26 000 3. රු.126 000 4. රු.125 000